## විශ්වකර්ම දවුම් පිලිස්සුම් හෙළ වෙදකම

පාරම්පරික වෛද්‍ය ප්‍රේමචන්ද්‍ර අලුපොතකුඹුර


දේශීය පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍රයන් අතුරින් දවුම් පිලිස්සුම් චිකිත්සාව ආශ්චර්යමත් ප්‍රතිකාර ක්‍රමයකි. හෙළ වෙදකමෙහි වටිනාකම වැඩි කරන දේශීය දවුම් පිලිස්සුම් වෙද පරම්පරා ගණනාවකි. ඒ අතරින් අලුපොතකුඹුර මහතා සිය පරම්පරාවෙහි වෙදකම ඉදිරියට ගෙන යන තෙවන පුරුකයි. පරම්පරා තුනකින් පැවතෙන මෙම හෙළ වෙදකම, ගින්දරින්, උණුවතුරින්, රත් වූ තෙලින්, වෙඩි බෙහෙතින්, උණු තාරවලින් සහ ඇසිඩ් ප්‍රහාරයන්ගෙන් මෙන්ම අධිබලැති විදුලිසැර වැදීමෙන් ලත් දවුම් පිලිස්සුම් තුවාල ආදී විශාල ප්‍රතිකාර ක්ෂ්ත්‍රයක රෝග සුව කිරීමෙහි විශ්වකර්ම හැකියාවකින් යුක්තව සිටී.

පිලිස්සීමෙන් අනතුරුව රෝගියා වෛද්‍යවරයා වෙත විනාඩි 40ක පමණ කාලයක දී යොමුවීම ප්‍රතිකාරය වඩාත් සාර්ථක කරයි. එහි දී වෙදදුරු විසින් ඖෂධ පැළෑටි දෙකක් පමණක් උපයෝගී කර ගනිමින් දින දෙකක් වැනි කෙටි කාලයක දී සුවය ලබා දෙනු ඇත. ආරම්භයේ දී පවතින දැවිලි, වේදනා සියල්ලක්ම ගිණි සිසිල මන්ත්‍රය මැතිරීමෙන් මිනිත්තු කිහිපයකදී දුරු කරනු ලැබේ. හිස සිට පාදාන්තය දක්වා කුමන ආකාරයකින්, ශරීරයෙහි කුමන ස්ථානයක් පිලිස්සීමකට ලක් වුවද, බාහිර බද්ධ කිරීම්, සැත්කම්, තෙරපුම් පැලැස්තර සිදු නොකොට සති තුනක කෙටි කාලයකදී සුවපත් කිරීමේ හැකියාව මෙම වෙදකම සතුවේ.

දවුම්-පිලිස්සුම් ප්‍රතිකාරයෙන් පසුව පිළිස්සුම් ස්ථාන රැලිවැටීම, ගැටිති හට ගැනීම, සමේ පැහැය වෙනස් වීම, පිලිස්සුණු ස්ථාන එකට ඇලීම සහ සන්ධි ක්‍රියාවිරහිතතාවය හට නොගැනීම දේශීය දවුම්, පිලිස්සුම් වෙදකමෙහි තවත් සුවිශේෂත්වය කි.

ශරීරයෙහි ප්‍රධාන ඉන්ද්‍රිය සහ අවයව වන දෑස, පපු පෙදෙස වැනි ස්ථානයක ඇතිවන පිලිස්සුම් සඳහා විශේෂිත ප්‍රතිකාර මෙම පරපුර සතුවේ.

දවුම් පිලිස්සුම් වෙදකමෙහි සාර්ථක බව පමණක් නොව සුදු කබර, පොතු කබර ආදී චර්මගත රෝග සහ ළඳරු මාන්දම, බාලගිරි දෝෂය ආදී බාල රෝග සඳහා ද ප්‍රතිකාරයෙහි නිපුණතාවක් මෙම පරම්පරාව සතු වේ.

වර්ෂ 1981 දී තම පියා ගේ අභාවයෙන් පසු ව වෛද්‍යකර්මය ආරම්භ කළ වෛද්‍ය ප්‍රේමචන්ද්‍ර අලුපතකුඹුර මහතා අවුරුදු 32ක් පමණ රෝගීන් සුවපත් කරමින් තත් කාර්යයෙහි නියුක්තව සිටින අතර, 2013 වර්ෂයේ මධ්‍යම පළාතේ හොඳම ආයුර්වේද වෛද්‍යවරයාට හිමි සම්මානය ද දිනා ගන්නා ලදී.

මෙම පරම්පරාව සතු ප්‍රතිකාර ක්‍රම අතරින් කිහිපයක් මෙසේ සඳහන් කළහැකිය.

1. පිලිස්සීමේ දී සම ගැලවී නැත්නම් පළමු ප්‍රතිකාරය ලෙස :

පිලිස්සුණු සැනින් ඖෂධ දෙකක් කොටා මිරිකා ඉස්ම ගෑමෙන් දැවිල්ල නැති වේ. මෙම ප්‍රතිකාර විධි සඳහා දියවැඩියාව වැනි අතුරු රෝගාබාධ බලනොපා යි.

2. සම ගැලවී තිබේනම් :

ඖෂධ වර්ග දෙකක් වරු තුනක් ගෑමෙන් දිය බුබුල නොකැඩී ජල පදාර්ථ ඉක්මනින් උපරිමයෙන් පිටතට ඇද දැමීම සිදු වේ.

මෙම ප්‍රතිකාරවල දී සැලකිලිමත් විය යුතු කරුණක් නම් පිලිස්සුණු විගස ඇල් වතුරෙන් නොසේදීමයි. ඇල්දිය දැමීමෙන් සැර පිටවීම වැළකී රෝග තත්ත්වය උත්සන්න වේ. එවැනි අවස්ථාවල දී මන්ත්‍ර මතුරා සිහිය ගෙන ප්‍රතිකාර කළ යුතු ය.

3. ඉන්පසු තෛල වර්ග යෙදීම සිදු කෙරෙයි උරගයකුගේ සම් කොටසක් හා තවත් උද්භිද ඖෂධ වර්ග තලතෙල් සමඟ මිශ්‍ර කර යෙදීමෙන් තෙල සිඳ ගනු ලබන අතර මෙය නැකත, දිශාව ආදිය සලකා බලා සිදු කළ යුතුය. මෙමගින් සම යථා තත්ත්වයට පත් වී හන්දි දිග හැරීම සිදු වේ. සති 3ක් පමණ කාලයක් ඇතුළත තුවාලය සුව වන අතර කැලල් මැකීම සඳහා මාස 3ක් පමණ ගත වේ. මෙහි දී තුවාලය නොවසා තැබීමට උපදෙස් දිය යුතුය. මෙම ප්‍රතිකාර පද්ධතියෙන් පුරාණ තුවාල වල වුව ද ගැටිති නැති කර සාමාන්‍ය මට්ටමට සම පත් කිරීම සිදු වේ. ගැඹුරට ම පිලිස්සුන ගැටිති සඳහා පැලෑටිමය චූර්ණයක් පුරවා ඉක්මනින් මස් පිරීම සිදු කරනු ලැබේ. එසේම ගොම පිලිස්සුම් තුවාල සඳහා විෂ වන බැවින් ගොම පොළවක රෝගියකු නොතබයි.

**පිලිස්සුන විගස කළ හැකි ප්‍රතිකාර**

- ගම් බිත්තර සුදුමදයක් ආලේප කිරීම
- මී පැණි ආලේපය
- කහඹිලියා හැර ඕනෑම ශාක වර්ගයක් (හෙන්දිරික්කා, දාස්පෙතියා ...) කොටා ඉස්ම ගෙන ආලේප කිරීම

**පිලිස්සුන විගස නොකළ යුතු දේ**

- ඇල් වතුරෙන් තෙමීම
- දන්තාලේප ආදිය ආලේප කිරීම

මෙම ප්‍රතිකාර පද්ධතියේ පපුවේ සිට යටි උදරය දක්වා පිලිස්සීමේ දී කැඳ වර්ග තුනක් භාවිත කරනු ලැබේ. එසේ ම ඇස් පිළිස්සීමේ දී විශේෂ ඖෂධ වර්ග භාවිත කරනු ලැබේ. ඇසිඩ් ආදිය මගින් ඇසට හානි වුවත් සති දෙකකින් පමණ සුව කිරීමේ හැකියාව මෙම වෙදකම සතුව පවතී.

දැනට මෙම මාහැඟි වෛද්‍යකර්මය පුස්කොළ පොත්වල ලියැවී තිබුන ද සංරක්ෂණයක් සිදු වී නොමැත. මේ නිසා පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍ර රැක ගැනීම ඉදිරි පරම්පරාවේ යුතුකමක් වී ඇත.